මගේ අංකය
எனது இல.
My No.

ඔබේ අංකය
உமது இல.
Your No.

පාර්ලිමේන්තුව
பாராளுமன்றம்
**PARLIAMENT**

ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ    ஸ்ரீ ஜயவர்தனபுர கோட்டே    Sri Jayewardenepura, Kotte

දුරකථනය
தொலைபேசி
Telephone    2777100

වි. තැපැල
மின் அஞ்சல்
E-Mail    sgp@parliament.lk

ෆැක්ස්
பெக்ஸ்
Fax    2777227

2010 මාර්තු මස 04 වැනි දින

සියලුම ගරු අමාත්‍යවරුන්/ නියෝජ්‍ය අමාත්‍යවරුන්
සහ හිටපු පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් වෙත,

ගරුතර ස්වාමීන්වහන්ස,
ප්‍රිය මහත්මයාණෙනි/ මහත්මියනි,

**පාර්ලිමේන්තුව රැස්වීම පිණිස කරන කැඳවීම**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 155 (4) (i) වැනි ව්‍යවස්ථාවෙන් සහ මහජන ආරක්ෂක ආඥාපනතේ 2 වැනි වගන්තියෙන් පැවරී ඇති බලතල ප්‍රකාර අතිගරු ජනාධිපතිතුමා විසින් හදිසි අවස්ථා තත්ත්වයක් ප්‍රකාශයට පත් කල බව පාර්ලිමේන්තුවට දන්වා සිටීම සඳහා දැනට විසුරුවා හැර ඇති පාර්ලිමේන්තුව 2010 මාර්තු මස 09 වැනි අඟහරුවාදා පූ.භා. 9.30 ට රැස්වීම පිණිස කැඳවා ඇති බව දන්වා සිටිමි.

මේ අනුව, මහජන ආරක්ෂක ආඥාපනත යටතේ යෝජනාව සම්මත කරගැනීම පිණිස දැනට විසුරුවා හැර ඇති පාර්ලිමේන්තුව 2010 මාර්තු මස 09 වැනි අඟහරුවාදා පූ.භා. 9.30 ට රැස්වන බව මෙයින් දන්වා සිටිනු කැමැත්තෙමි.

2010.03.02 දිනැති අංක 1643/6 සහ 1643/20 දරන අති විශේෂ ගැසට් පත්‍ර ඔබගේ පහසු යොමුව පිණිස මේ සමග එවමි.

මෙදින රැස්වීමට අදාළ න්‍යාය පත්‍රය යථා කාලයේ දී ඔබ වෙත එවනු ලැබේ.

ස්තුතියි.

මෙයට විශ්වාසී,

නීල් ඉද්දවල,
වැඩබලන පාර්ලිමේන්තුවේ මහ ලේකම්